# 16 අයියනායක පද්‍ය පන්තිය

අයියනායක මැයෙන් වන මේ කවි පන්තිය රචනා කොට ඇත්තේ කොළඹ යුගයේ සුප්‍රසිද්ධ කවියකු වූ විමලරත්න කුමාරගම විසිනි. හෙතෙම පාසල් වියේ සිට ම එකල පැවති පුවත්පත් සඟරා ආදියට කවි ලියමින් ස්වකීය කවිත්වය වර්ධනය කර ගත්තේ ය. ආදායම් පාලක නිලධාරියකු වශයෙන් වන්නිය වැනි දුෂ්කර ප්‍රදේශවල වැඩිපුර ම කාලය ගෙවූ මෙතුමාගේ කවිවලට බෙහෙවින් ම පසුබිම් වී ඇත්තේ වන්නියේ ජනයා ගෙවූ කටුක දිවිපෙවෙතයි. ගැමියන්ගේ දුෂ්කර ජීවිතය දෙස මහත් දයාවෙන් බැලූ කුමාරගම කවියා තම අත්දැකීම් දැඩි මානව භක්තියකින් යුතු ව චිත්‍රණය කළේ ය. දහස් ගණනක් කවි ලියා ඇති කුමාරගම මහතාගේ පද්‍ය නිර්මාණ අතර 'හපුමලී' හා 'මහ පාර' යන ග්‍රන්ථවල ඇතුළත් ය. **ආරච්චිරාල, ආගන්තුක සත්කාරය, හේරත්හාමි, සිරගෙය, වලස් දඩයම, බුදුරුව** ආදී කවි පන්තිත් කුමාරගම කවියාගේ විශිෂ්ට නිර්මාණ සේ සැලකේ.

ඔහු විසින් 1948 වර්ෂයේ දී රචනා කරන ලද අයියනායක නම් වූ මෙම පද්‍ය පන්තියෙන් වන්නියේ ජනයාගේ ජීවිතයේ අනුවේදනීය පක්ෂය දයාවෙන් හා සංයමයෙන් යුතු ව ඉදිරිපත් කෙරේ.

**1.** **සෙවණැලි අවදි නොමවන වැව් ඉවුරු කොණේ**  
**කාලය විසින් හැරුව නුග ගසක බෙණේ**  
**මල කා කළු ව ගිය ආයුද කැබලි පෙණේ**  
**දෙවියෙක් නැත ද මෙහි බලයක් තිබෙනු දැණේ**

**2.** **බුද ගුරු සනි හිරුට හිමි හැම දවස් වල**  
**මේ සන්හිඳේ එළියක් ඇත සවස් කල**  
**ලෙඩ දුක්වලින් මිදුමට බාරයක් කළ**  
**හැම දෙන එතැන රැස්වෙති ගම ගෙවල් වල**

**3.** **වනපෙත දැවෙන විට වැද මළ හිරුගෙ රත**  
**ගනඳුර වසන විට ආලෝකයෙහි නෙත**  
**සඳරැස් ගලන විට තෙරපී සෙවණ මත**  
**එක දෙවියෙක් නොවේ දාහක් එතැන ඇත**

**4.** **දෙව් දේවතාවුන් සැරිසරන මහ වනේ**  
**පවතින බලය ඇඟ ලොම් තුඩකට ද දැනේ**  
**මොළයෙන් තමා ලෝකයෙ සුවය වැනසුණේ**  
**මගෙ ගැරහුමට නැත ඒ පිරිස යොමු වුණේ**




නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5. සන්හිඳ ළඟ බාරයට කිරි ඉතිරීම
කෙම්මුර දවස්වල පානින් සැරසීම
වන අතු කඩා ගස් දෙබලක දැවටීම
මා නො කෙරුවත් නො කෙළෙම් එය ගැරහීම

6. සාගත වසංගත හා එන නියඟ වලින්
සහනය පතා වන දෙවියන් ළඟට කෙළින්
එන මේ පිරිස සැරසීමට නුවණ මලින්
පෙලඹෙන අයට අනුකම්පා කරමි මුලින්

7. ගංගොඩ වටා මෝරන වන ලැහැබ මැන
අහුමුලු නෑර සිය අණසක පතුරු වන
බලවත් අයියනායක, දෙන ගොදුරු ගෙන
මේ අය රකිනු මැන යන එන සියලු තැන

8. මාපිල් පිඹුරු නා පොළඟුන් සිටින තැන
අලි කොටි වලස් මුළු කොලහල කරන තැන
නිතර ම ඔබ පුදන මේ අය ඇඳින ගෙන
බලවත් දෙවිතුමනි, දිව රෑ රකිනු මැන



අරුත් පැහැදිලි කිරීම්

අයියනායක : වන්නියේ ජනයා මහත් භක්තියෙන් අදහන දෙවිකෙනෙකි.

සන්හිඳ : වන්නියේ ජනයා තම දුක් කම්කටොලු ආදියට සැනසීමක් ලබා ගැනීම පිණිස අනාදිමත් කාලයක සිට පුද පූජා, බාරහාර පවත්වන ගුප්ත බලයක් හා දේව අනුහස් ඇතැයි විශ්වාස කරන පූජනීය ස්ථානය. (දුක් දෙම්නස් සන්හිඳුවන ස්ථානය)

කෙම්මුර දවස් : දෙවියන්ට පුද පූජා පැවැත්වීම හා බාරහාර වීම සඳහා සම්මතයේ පවත්නා බදාදා හා සෙනසුරාදා දින කෙම්මුර දින සේ සැලකේ.

## ක්‍රියාකාරකම 01

කණ්ඩායම් කීපයකට බෙදී මේ කවි පන්තිය ගායනය කරන්න.

## ක්‍රියාකාරකම 02

පාඩම ඇසුරින් මේවාට පිළිතුරු සපයන්න.

i ජනයා සන්හිඳේ පිහිට පැතුයේ කවර කරුණු සඳහා ද?
ii සන්හිඳ පිහිටි ස්ථානය ගැන විස්තරයක් කරන්න.
iii කෙම්මුර දවස් නම් කරන්න.
iv එදිනෙද ජීවිතයේ ගැටලු විසඳාගැනීමට ගැමියන් කටයුතු කළ ආකාරය මෙහි කියවේ. එය පැහැදිලි කරන්න.
v ගැමියන් ජීවත් වුණු පරිසරය ගැන විස්තරයක් ලියන්න.

## ක්‍රියාකාරකම 03

මේ යෙදුම් පැහැදිලි කරන්න.

i **සෙවණැලි අවදි නොම වන වැව් ඉවුරු** **කොණේ**
ii **කාලය විසින් හැරුව නුග ගසක** **බෙණේ**
iii **වනපෙත දැවෙන විට වැද මළ හිරුගෙ** **රත**

| | | |
|---|---|---|
| iv. | **ගනඳුර වසන විට ආලෝකයේ** | **නෙත** |
| v. | **මොළයෙන් තමා ලෝකයෙ සුවය** | **වැනසුණේ** |
| vi. | **එන මේ පිරිස සැනසීමට නුවණ** | **මලින්** |
| vii. | **ගංගොඩ වටා මෝරන වන ලැහැබ** | **මැන** |

## ක්‍රියාකාරකම 04

**නාම විශේෂණ**

නාම ගැන වැඩි විස්තර සපයන පද නාම විශේෂණ නම් වේ. විශේෂණ පදයෙන් විස්තර වන පදය විශේෂ්‍යය වශයෙන් හැඳින්වේ. විශේෂණය විශේෂ්‍යයට පූර්වයෙන් යෙදීම ගද්‍යයේ සාමාන්‍ය පිළිවෙළයි. අර්ථය අවුල් නොවන සේ විශේෂණ යෙදිය යුතු ය. විශේෂණ පද කීපයක් වුව ද එක් නාම පදයක් සඳහා යෙදිය හැකි අතර විශේෂණය විස්තරාත්මක කොට ද දැක්විය හැකි ය.

**මේ වාක්‍යවල ඉරි ඇඳි පද කෙරෙහි අවධානය යොමු කරන්න.**

වන්නියේ අසරණ ගැමියෝ අයියනායක දෙවියන් අදහති.
ගන අඳුර නිල් අහස වසමින් සිටී.
මේවායේ ඉරි ඇඳි පදවලින් දැක්වෙන්නේ නාම විශේෂණ ය.

**පහත දැක්වෙන වාක්‍යවල විශේෂණ විශේෂ්‍යය නිසි ලෙස ගළපා වාක්‍ය සකස්කොට ලියන්න.**

i. මලානික නියං සමයේ ගස්වැල් විය.
ii. ආර්ථික තත්ත්වය රටේ වගා ව්‍යාපාරයෙන් දියුණු වේ.
iii. මහන්සි වී හෙතෙම දැඩි සේ වස්තුව සපයයි.
iv. මැලේරියාව ආදී බොහෝ අපට දුක් දෙන රෝග දුරු කිරීමට වෙහෙස දරන සාර්ථකයි.
v. ඇළේ දිය පිරී ඇති මාළු පැටව් නා නා ක්‍රීඩා කරති.
vi. ළමයි විනීත ගති ඇති තම නීති රීතිවලට පාසලේ ගරු කරති.
vii. හිතකර නිර්මාංසාහාර ශරීරයට බව ආයුර්වේද පුරාණ අපේ පොතපතෙහි දැක්වේ.
viii. ගොයම් කරල් පැසුණු රන්වන් මිටි බඳිමින් හිසට ගෙවිලිය ගතී.
ix. බමරු මුවරඳින් මත් ව විලේ සුපුල් ගුමු නද දෙති.

## ක්‍රියාකාරකම 05

මෙම කවියාගේ වෙනත් පද්‍ය නිර්මාණ සොයා ගෙන පන්තිය ඉදිරියේ කියවන්න.